www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**නික් බීම්ස් 70 වන සංවත්සර රැස්වීම අමතයි**

# ධනවාදී බිඳවැටීම සහ හතර වන ජාත්‍යන්තරයේ විප්ලවවාදී ඉදිරිදර්ශනය

***1 වන කොටස***

**Nick Beams addresses 70th anniversary meeting**
**Capitalist breakdown and the revolutionary perspective of the Fourth International**
**Part 1**

**නික් බීමස් විසිනි**
**2008 ඔක්තෝබර් 4**

*පහත පලවන්නේ හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ 70 වන සංවත්සරය වෙනුවෙන් සැප්තැම්බර් 28 දා සිඩ්නි නුවර පැවති ප්‍රසිද්ධ රැස්වීමකට නික් බීම්ස් විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවක පලමු වන කොටසයි. බීම්ස් ලෝක සමාජවාදී වෙබ් අඩවියේ ජාත්‍යන්තර කර්තෘ මන්ඩලයේ සාමාජිකයෙකු මෙන් ම ඕස්ට්‍රේලියාවේ සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ද වේ. ලෝක සමාජවාදී වෙබ් අඩවිය බීම්ස්ගේ වාර්තාව කොටස් හතරකින් පල කරනු ඇත.*

1938 දී හතර වන ජාත්‍යන්තරය පිහිටුවීමේ ද 1953 සිට මේ දක්වා හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව විසින් නායකත්වය දෙන ලද, ට්‍රොට්ස්කිවාදී ක්‍රියාමාර්ගය ආරක්ෂා කිරීමේ හා වර්ධනය කිරීමේ 70 වසරක අරගලයේ ද ඓතිහාසික අර්ථභාරය, ලෝක ආර්ථිකය තුල දැන් දිගහැරෙමින් පවතින අවුල් වියවුල් සහගත සිද්ධීන් මගින් අවධාරනය කෙරෙමින් පවතී.

සෑම දිනක ම මූල්‍ය පද්ධතිය තුල හටගන්නා ව්‍යසන හා අර්බුද පිලිබඳ නව ප්‍රවෘත්ති එලිමහනට එයි. ගෝලීය මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරිත්වය පවත්වා ගැනීමේ උත්සාහයක් ලෙස මහ බැංකු හා මූල්‍ය අධිකාරීන් විසින් ඒ හෝ මේ අතට විසි කරනු ලබන ට්‍රිලියන ගනන් දක්වා දිවෙන ඩොලර් සිය බිලියන ගනන් මුදල් සම්භාරයන් ගනන් තබා ගැනීම පවා කල නොහැකි තරම් ය.

පසුගිය දෙසතිය තුල, වසර 158ක් පැරනි මූල්‍ය ආයතනයක් වන ලේමන් බ්‍රදර්ස් බංකොලොත්වීම, කොටස් බ්‍රෝකර් ආයතනයක් හා ආයෝජන බැංකුවක් වන මෙරිල් ලින්ච් පවරාගැනීම සහ බංකොලොත්වීමෙන් ආරක්ෂාව ලබා ගනු වස් බැංකු තත්වය ලබා ගැනීමට ගෝල්ඩ්මන් සැච්ස් හා මොර්ගන් ස්ටැන්ලි ආයතන දැරූ උත්සාහය අපි දැක ඇත්තෙමු. එම කාල පරිච්ඡේදය තුල දී ම, මාර්තුවේ දී බෙයාර් ස්ටර්න්ස් බැංකුව බිඳ වැටීමෙන් පසුව වෝල් වීදියේ ඉතිරිව පැවති ආයෝජන බැංකු හතර ඒ හෝ මේ ආකාරයෙන් මූල්‍යමය වසයෙන් අසාර්ථකත්වයට පත්ව තිබේ. තව දුරටත්, ඒඅයිජී නම් දැවැන්ත රක්ෂන සමාගමට ඩොලර් බිලියන 85ක් වැය කොට ඇප දීමට සිදුව ඇත. පසුගිය බ්‍රහස්පතින්දා, ඩොලර් බිලියන 307ක වත්කම්, ඩොලර් බිලියන 188ක තැන්පතු සහ ශාඛා 220කට අධික සංඛ්‍යාවක් සහිත වොෂිංටන් මියුචුවල් බැංකුව කඩාවැටුනි. එය ඉතිහාසයේ විශාලතම බැංකු කඩාවැටීම යි.

බුෂ් පාලනාධිකාරය, ඩිමොක්‍රැටිකයන්ගේ මූලික සහයෝගය ද සහිතව, වෝල් වීදියේ පොත්වල සටහන්ව ඇති නොවටිනා මූල්‍යමය වත්කම් මිලදී ගැනීම මගින් වෝල් වීදිය ඇප දී ගලවා ගැනීමේ මෙහෙයුමක් වෙනුවෙන් ඩොලර් බිලියන 700ක් වැය කිරීමට යයි.

මහා අවපාතයට තුඩු දුන් 1929 සිද්ධීන්ගෙන් පසුව පැවති වඩාත් ම දරුනු මූල්‍ය අර්බුදයට ලෝක ධනපති ක්‍රමය ඇතුලු වී ඇති බවට අදහස් දැක්වීම අටුවාකරුවන්ට හා ආර්ථික පන්ඩිතයන්ට දැන් සාමාන්‍ය දෙයක් බවට පත්ව ඇත.

ඉතිං ලොව පුරා ජනතාව එම සිද්ධීන්ගෙන් පසුව කුමක් සිදුවුනි ද යන්න යලි මතකයට නගා ගැනීමට පටන් ගෙන තිබේ: එනම්, 1933 දී ජර්මනියේ නාසීන් බලයට පත්වීම, මහජන විරැකියාව, ප්‍රතිවාදී කඳවුරුවලට හා අධිරාජ්‍යයන්ට ලෝකය බෙදීම, සහ වෝල් වීදියේ කඩාවැටීමෙන් දශකයකට පසුව, දෙවන ලෝක යුද්ධය පිපිරීම සහ කෝටි සංඛ්‍යාවක් මරනයට පත්වීම.

ආන්ඩු සහ මූල්‍ය අධිකාරීන් ගැටලු පිලිබඳව දන්නා බැවින් ද ඒවා විසඳගැනීමේ විධික්‍රම ඔවුන් සතුව ඇති බැවින් ද ලෝකය නතර වී නැති බවටත් 1930 ගනන් පුනර්කරනය වීමක් සිදු නොවන බවටත් පන්ඩිතයන්, මාධ්‍යවේදීන් සහ දේශපාලනඥයෝ එක සේ යලි යලිත් සහතික වෙති.

එවන් යලි සහතික වීම් ඉදිරිපත් කරනු ලබන්නේ, ඊයේ වන තෙක් ම, නව මූල්‍ය ක්‍රමයේ වරුනාව දේශනා කරමින් සිටි මිනිසුන් විසින් නොවේ නම්, ඒවාට එතරම් වැදගත්කමක් නොතිබෙනු ඇත.

මාක්ස්වාදී ව්‍යාපාරයට නම්, මෙම අර්බුදය හිටි අඩියේ හිස් ආකාශයෙන් කඩා වැටුනු එකක් නොවේ. එය වනාහි, අපගේ ව්‍යාපාරය පැහැදිලි කර ඇති අයුරු, ධනපති ක්‍රමයේ බිඳවැටීමට නොවැලැක්විය හැකි ලෙසම තුඩු දෙන, ගැඹුරට විහිදුනු ප්‍රතිවිරෝධතාවල ප්‍රතිඵලයයි.

අප "බිඳවැටීමක්" ගැන කතා කරන විට, අප පෙන්වා දෙන්නේ තනි සිද්ධියක් -- එනම්, ධනවාදය හදිසියේ ම ඇන හිට එහි ක්‍රියාකාරිත්වය නතර වන අවස්ථාවක් -- නොව, ඓතිහාසික ක්‍රියාදාමයකි. ගෝලීය ධනවාදයේ ව්‍යුහයන් තුල සිදු වන දැවැන්ත වෙනස්කම් -- මූල්‍ය පද්ධතිය බිඳවැටීම, නය හා මූල්‍ය වෙලඳ පොලවල් කඩා වැටීම සහ ප්‍රධාන බැංකු හා ආයෝජන ආයතන බංකොලොත්විම -- වසර ගනනක් තිස්සේ හා දශක ගනනක් තිස්සේ පවා ආර්ථික ජීවිතයේ මතුපිටට යටින් සිදු වෙමින් පවතින වෙනස්කම්වල ප්‍රතිඵල ය.

බිඳවැටීමක් යන්නෙන් ධනවාදය නතරවීමක් කරා පැමින ඇතැයි අදහස් නොවේ. එයින් පෙන්නුම් කෙරෙන්නේ, ආර්ථික හා දේශපාලනික යන ක්ෂේත්‍ර දෙකේ මෙන් ම දෘෂ්ටිවාදයන් හා චින්තන විධික්‍රම යන අංශවල ද පැරනි ව්‍යුහයන් විස්ථාපනය වන සහ සමාජයේ ඉරනම ම තීන්දු කෙරෙන දේශපාලන අරගලයේ නව රූපාකාර වර්ධනය වන ඉතිහාසයේ නව කාල පරිච්ඡේදයක ආරම්භය යි.

මාක්ස් පන්ති අරගලයට සැඳහුම් කරමින් එය "වරෙක විවෘත, වරෙක සැඟවුනු" එකක් ලෙස විස්තර කලේ ය. පසුගිය කාල පරිච්ඡේදය තිස්සේ එය තරමක් දුරට සැඟවී පැවතුනි. ඒ කුමන අර්ථයෙන් ද කියතොත්, සිය ජීවන තත්වයන්ට හා සමාජ කොන්දේසිවලට එල්ල වන නිමක් නැති ප්‍රහාරවලට ප්‍රතිචාරයක් වර්ධනය කර ගැනීමට කම්කරු පන්තිය අපොහොසත් වූ හෙයිනි. එහෙත් දැන්, එක්සත් ජනපදය තුල, වෝල් වීදියට ඇප දීමේ සැලසුමට එරෙහිව දැවැන්ත වෛරයක් පැන නැගීමත් සමග, එය පුපුරා මතුපිටට පැමින ඇත. මෙම වෛරය නව දේශපාලන යුගයක ආරම්භය සනිටුහන් කරයි.

ලෝක ධනවාදී පර්යායේ දිග හැරෙන බිඳවිසිරීමෙන් අදහස් කෙරෙන්නේ, කම්කරු පන්තිය දේශපාලන බලය සියතට ගෙන සමාජය නව සමාජ, ආර්ථික, දේශපාලන මෙන් ම සදාචාරමය පදනම් මත යලි සංවිධානය කිරීමේ අවශ්‍යතාවට මුහුන දෙන්ට යන බව යි. විසි වන සියවසේ ලේවැකි ඉතිහාසය එතරම් පැහැදිලිව පෙන්නුම් කරන පරිදි, මෙම කර්තව්‍යය සිදු කිරීම මත මනුෂ්‍ය වර්ගයාගේ ම අනාගතයට නොඅඩු දෙයක් රදා පවතී.

## වෝල් වීදියට ඇපදීම

සමාජය අතිමූලික ලෙස ප්‍රතිසංවිධානය කිරීමේ අවශ්‍යතාව වත්මන් අර්බුදය තුලින් පැනනගින්නේ, සමාජවාදීන්ගේ ඉල්ලීම්වලින් හෝ උද්ඝෝෂනවලින් මුලුමනින් ම ස්වාධීනව ය. එය මතුකෙරෙන්නේ මුලුමනින් ම වෛෂයිකව ය.

ඇමරිකානු මූල්‍ය කතිපයාධිකත්වය ද මහා ව්‍යාපාරිකයන්ගේ පක්ෂ දෙකෙහි ඔවුන්ගේ දේශපාලන නියෝජිතයන් ද අත ක්‍රියාවට දැමීමට ආර්ථික සැලසුමක් ඇතඃ එනම්, මිලියන සංඛ්‍යාත වැඩ කරන ජනතාවගේ ශ්‍රමය මගින් නිර්මානය කරන ලද සමාජයේ සම්පත් ධනවතුන්ගේ හා සුපිරි ධනවතුන්ගේ ධනය ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් බලමුලු ගැන්විය යුතු ය. මෙම ස්ථරය සමපේක්ෂක හා අතිශයින් ම සැක කටයුතු මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලාභ ගරා ගෙන ඇත. එහිදී පසුගිය 25 වසර තිස්සේ "නිදහස් වෙලඳ පොලේ" ධජය යටතේ, ආදායම් පරිමානයේ ඉහල දෙසට ධනය දැවැන්ත ලෙස යලි බෙදාගැනීමක් අත්දැක ඇත.

ජන මාධ්‍යවල සියලුම කොටස් විසින් එතරම් වෙහෙස නොබලා නිර්මානය කරනු ලැබ ඇති දේශපාලන ව්‍යාකුලත්වය තිබිය දී ම, මෙම සැලසුම එහි යථා ස්වරූපයෙන් ම හඳුනාගනු ලැබේඃ එනම්, අතිමහත් බහුතරයේ වියදමින්, වෝල් වීදිය, සමාජයේ ධනවත් ම ස්ථරයේ ඉතා කුඩා සුලුතරයක්, ඇප දී ගලවා ගැනීම.

එය පැවැත්වීමට පවා පෙරාතුව, 2008 එක්සත් ජනපද ජනාධිපතිවරනය අර්ථවිරහිත දෙයක් බවට දැනටමත් පත්ව ඇත. ඒ මක් නිසාද කියතොත්, සමාජ වැඩපිලිවෙලක් පිලිබඳ මොන යම් හෝ අපේක්ෂාවක් දැන් අත්හැර දැමීමට නියමිත නිසා ය. ඒ වෙනුවට, එක්සත් ජනපදයේ සෑම මිනිසකු, ගැහැනියක හෝ ලමයකු වෙනුවෙන් ඩොලර් 2,300කට සමාන වන මුදල් ප්‍රමානයක් ධනවතුන් අතට මාරු කිරීමට නියමිත ය. ප්‍රථම ජනාධිපතිවරන විවාදයේ දී නිවේදකයා විසින් අසන ලද මුල්ම ප්‍රශ්නවලින් එකක් වූයේ, ඇප දීමේ සැලසුම සැලකිල්ලට ගත් කල ඔබ කප්පාදු කිරීමට යෝජනා කරන්නේ ආන්ඩුවේ කුමන වැඩපිලිවෙලවල් ද යන්නයි. කප්පාදු කිරීමට සිදු වනු ඇත යන්න පිලිබඳව සියල්ලෝ ම එකඟ ය. එය පිලිගනු ලැබ ඇති නිශ්චිත දෙයකි.

ඇමරිකානු පාලක පන්තියට මෙම වැඩපිලිවෙල ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ක්‍රියාවට දැමිය නොහැකි ය.

එබැවින්, භාන්ඩාගාර ලේකම් පෝල්සන් විසින් යෝජනා කරනු ලැබ ඇති විධිවිධාන තුල, අපට දැකිය හැක්කේ, ආඥාදායකත්වයක බල හේතු ය.

වියදම් සම්බන්ධයෙන් අධීක්ෂනයක් සහිත ව්‍යවස්ථාදායක සභාව යයි කියනු ලබන, කොංග්‍රස් මන්ඩලය වෙත යවන ලද ආරම්භක ලියවිල්ල යන්තම් පිටු තුනක් දිග එකකි -- එක් අටුවාකරුවකු නිව් යෝර්ක ටයිම්ස් පත්‍රයේ සඳහන් කර තිබූ පරිදි, අවමුඛ උගසක් සඳහා අවශ්‍ය කෙරෙන ප්‍රමානයටත් වඩා දිගින් අඩු ලියවිල්ලකි.

ආරම්භක ලියවිල්ලට අනුව, "කිසිදු සීමාවකින් තොරව", භාන්ඩාගාර ලේකම්ට පවතින බලතල අතර, "මෙම පනතට අදාල එවන් සියලු සාධාරන රාජකාරී" සිදු කල හැකි "ආන්ඩුවේ මූල්‍ය ඒජන්තයන් ලෙස මූල්‍ය ආයතන නම් කිරීම" ද වනු ඇත. මෙයින් අදහස් කෙරෙන්නේ, සමපේක්ෂන ක්‍රියාකාරකම්වල, සමහර අවස්ථාවන්හි දී, අර්බුදයට තුඩු දුන් විවෘත සාපරාධී ක්‍රියාකාරකම්වල, යෙදුනු එම මූල්‍ය ආයතන ම, ඇප දීම සංවිධානය කිරීමේ දී භාන්ඩාගාරයට සහාය පිනිස කැඳවීමට නියමිත බව යි. *ලෝක සමාජවාදී වෙබ් අඩවියේ* මෑත ලිපියක් සටහන් කල පරිදි, "බැඳියා පිලිගැටුම" යන පදය සිදු වෙමින් පවතින දෙය වගවිභාග කිරීම පටන් ගන්නේ වත් නැත.

එපමනක් නොව, සැලසුම භාන්ඩාගාරයට නෛතික මුක්තියක් සම්පාදනය කරයි. "අධිකාරියට අනුකූලව ලේකම් විසින් ගනු ලබන තීන්දු යලි සලකා බැලීමට යටත් නැති අතර . . . කිසිදු අධිකරනයක් මගින් හෝ කිසිදු පරිපාලනමය ඒජන්සියක් මගින් ඒ පිලිබඳව යලි සලකා බැලීමක් නොකෙරෙනු ඇත."

මේ වචනවලින්, සැප්තැම්බර් 23 දා *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රයේ ලිපියකට අනුව, "එක්සත් ජනපදයේ ආර්ථික හා මූල්‍ය ජීවිතය සම්බන්ධයෙන් තනි පුද්ගලයකුට මේ වන තෙක් ප්‍රදානය කරනු ලැබ ඇති වඩාත් ම විශ්වාස කල නොහැකි තරම් බලතල ප්‍රමානයක් භාන්ඩාගාර ලේකම් -- මාස කිහිපයකින් එම තනතුරේ කවුරු හිටියා වුවත් -- අතට ලැබෙනු ඇත. එය වනාහි 9/11න් පසුව, දේශප්‍රේමී පනතේ මූල්‍ය සමකය යි." පෝල්සන්ගේ යෝජිත පනත "ඇමරිකානු ආර්ථික ඉතිහාසයේ වඩාත්ම විශ්මයජනක බල කොල්ලය" ලෙස *ටයිම්ස්* විස්තර කලේ ය.

ආර්ථිකයේ හා දේශපාලනයේ දිගු කාලීනව පැවත එන සිද්ධාන්තයක් නම්, අර්බුදයක දී, අහඹු හා අත්‍යවශ්‍ය නොවන දෑ ඉවතට විසි වී, සැබෑ සබඳතා එලිමහනට පැමිනෙන බවයි. මෙම අර්බුදයේ දී ද සිදු වී ඇත්තේ එයයි. මහජනයා උදෙසා වන, මහජනයා විසින් ගෙන යනු ලබන මහජනයාගේ ආන්ඩුවක් නොව, මිලියන සංඛ්‍යාත ජනයාගේ තීන්දු ආර්ථික ප්‍රතිඵල නිර්නය කරන" නිදහස් වෙලඳ පොල" නොව. ධනවතුන් උදෙසා ධනවතුන් විසින් ගෙන යනු ලබන ධනවතුන්ගේ ආන්ඩුවකි. ප්‍රජාතන්ත්‍රවාදය හා නීතියේ පාලනයක් නොව, මූල්‍ය ප්‍රාග්ධනයේ ආඥාදායකත්වයකි.

එක්සත් ජනපද මූල්‍ය ප්‍රාග්ධනයේ අවශ්‍යතා වෙනුවෙන් තෙල් හා සෙසු සම්පත් පාලනය කිරීමේ එල්ලයෙන් යුක්තව, ඇෆ්ඝනිස්ථානය හා ඉරාකය තුල ඇමරිකානු අධිරාජ්‍යවාදය විසින් දියත් කරනු ලැබූ කොල්ලකාරී යුද්ධ, දැන් දේශීය පෙරමුනෙහි විවෘතව සිදු කෙරෙයි. ඊනියා "ත්‍රස්ත විරෝධී යුද්ධයේ" දී ආරම්භ කෙරුනු ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එරෙහි ප්‍රහාර ගැඹුරු කිරීමක් ඒවා සමග එකට යනු ඇත.

**මතු සම්බන්ධයි.**

© www.wsws.org